**15-01-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, 'අහෝ දෙවියනි! අහෝ බාබා!' යන වචන ඔබේ මුවින් පිට නොවිය යුතුය. එම පුරුද්ද අයිති භක්ති මාර්ගයටයි.

**ප්‍රශ්නය:** ඔබ දරුවන් සුදු ඇඳුමට ප්‍රිය කරන්නේ ඇයි ? ඉන් ඇඟවෙන්නේ කුමක් ද ?

**පිළිතුර:** ඔබ දැන් මේ ජරාජීර්ණ ලෝකයෙන් අත් මිදී මරණයට පත් වී ඇති නිසාය ඔබ සුදු ඇඳුම ප්‍රිය කරන්නේ. සුදු ඇඳුම මරණය සංකේතවත් කරයි. කෙනෙක් මරණයට පත් වූ විට සුදු ඇතිරිල්ලකින් වසා දමයි. ඔබ දරුවන් දැන් ජීව මරණයට පත් වූ අයයි.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා මෙහි සිට ඔබ දරුවන්ට විස්තර කර දෙයි. ඔබ 'ආධ්‍යාත්මික' යන වචනය භාවිත නොකර 'පියා' කියා කීම ද කම් නැත. පරමාත්ම පියා මෙහි සිට විස්තර කරයි. ඔබ සැම කියන්නේ ඔබ සැම සහෝදරයින් කියාය. පරම පියා එය තේරුම් කරයි. ඔහු හැම කෙනෙකුටම තේරුම් කරන්න යන්නේ නැත. ඔබ සැම කියන්නේ ඔබ සහෝදරයින් කියාය. ගීතාවේ, දෙවියන් කතා කරයි යන්න සඳහන් වෙයි. දෙවියන් කතා කරන්නේ කාටද? සියල්ලන්ම පරමාත්ම දෙවියන්ගේ දරුවන්ය. ඔහු පරමාත්ම පියා වන නිසා පරමාත්ම දෙවියන්ගේ දරුවන් සියලු දෙනාම සහෝදරයින්ය. පියා නිසැකයෙන්ම ඔබට විස්තර කර රාජයෝගා උගන්වයි. ඔබේ බුද්ධියේ යතුරු දැන් විවෘත වී ඇත. ලෝකයේ වෙන කාටවත් මෙවැනි සිතිවිලි නැත. මේ පණිවිඩය ලැබුණු අය දිගටම පාසලට පැමිණ ඉගෙන ගනියි. ඔවුන් සිතන්නේ ප්‍රදර්ශනය දුටු නිසා දැන් වැඩි ඥානයක් ලබා ගැනීමට ආ යුතු බවයි. ප්‍රධාන සහ පළමු දේ වන්නේ මේ වචන වූ කලී ඥාන සාගරය වූ, පාරිශුද්ධකරුවනාණන් වූ, විමුක්ති දායකයා නම් වූ ශිවා වන ගීතා දේශකයාගේ බවය. පළමුවෙන්ම ඔවුන් දැනගත යුතුයි, කවුද අපට විස්තර කර උගන්වන්නේ කියා. ඒ වූ කලී අශරීරික වූ, ඥාන සාගරය වූ උත්තරීතර ජීවාත්මයයි. ඔහු සත්‍යයම වේ. ඔහු කියන දේ ද සත්‍යයම පමණි. එවිට කිසිඳු ප්‍රශ්නයක් පැන නොනඟී. පළමුවෙන්ම ඔබ විස්තර කළ යුතුයි උත්තරීතර ජීවාත්මය වන උත්තරීතර පියා බ්‍රහ්මා මඟින් රාජයෝගා උගන්වන බව. මෙය වූ කලී රාජකීය තත්ත්වයයි. කෙනෙකුට, මෙහි සිට ඔබට විස්තර කරන්නේ මෙම ලොවින් එපිට සිටින පරමාත්ම පියා, සියලු දෙනාගේ පියා බව ශ්‍රද්ධා විශ්වාසය ඇති වූ කල ඔහු ඉහළම අධිකාරිය බවට කිසිඳු ප්‍රශ්නයක් පැන නොනඟිනු ඇත. ඔහු පාරිශුද්ධ කරුවාණන්ය. ඒ නිසා ඔහු එන්නේ සහ ආ යුත්තේ ඔහුට නියමිත කාලයටමය. ඔබට දැකිය හැකියි මේ එම මහා භාරත සංග්‍රාමයම බව. විනාශයෙන් පසු පාපයෙන් තොර ලෝකය බිහිවේ. මෙය පාපකාරී ලෝකයයි. මිනිසුන් තේරුම් කරගෙන නැහැ භාරතය පාපයෙන් තොරව තිබූ බව. ඔවුන්ගේ බුද්ධිය අකර්මන්‍ය වී ඇත. ඒවාට ගොඩ්රෙජ් යතුරු දමා ඇත. පරම පියා ළඟ පමණි යතුර ඇත්තේ. මේ නිසාය ඔහුට කියන්නේ මහා ඥාන දායකයා සහ දිව්‍යමය ඇස ලබා දෙන්නා කියා. ඔහු ඔබට ඥානය නම් වූ තෙවෙනි ඇස ලබා දෙයි. කවුද උගන්වන්නේ යන්න කිසිවෙකුට තේරුමක් නැත. ඔවුන් ඒ දාදා (බ්‍රහ්ම බාබා) යි කියා සිතන නිසා ඔවුන් විවේචන පටන් ගනී මොනවා හෝ කියයි. ඒ නිසා මෙය මුලින්ම තේරුම් කර දිය යුතුයි. මෙසේ ලියවී ඇත ශිව දෙවියන් කතා කරයි. සත්‍යය යනු ඔහුය. පරම පියා මෙසේ විස්තර කරයි පාරිශුද්ධකරුවා වන ශිවා මමයි. මම උත්තරීතර දනව්වේ සිට ඉගැන්වීම සඳහාම ඔබ වෙත ආවෙමි. එම පියා ඥානයෙන් පිරුණු කෙනාය. ඔහු ලෝකයේ මුල, මැද සහ අග හී රහස් සියල්ල විස්තර කරයි. ඔබට මෙකළ පමණයි අසීමිත පියාගේ ඉගැන්වීම් ලැබෙන්නේ. ඔහු ලෝකයේ නිර්මණකරුය. ඔහු කරන්නේ අපිරිසිඳු ලෝකය පිරිසිඳු කිරීමයි. ඔවුන් මෙසේ අඬගසයි අහෝ පාරිශුද්ධකරුවාණනි, පැමිණෙන්න! ඒ නිසා පළමුව ඔහුගේ හැඳින්වීම ලබා දෙන්න. එම උත්තරීතර ජීවාත්මය වන උත්තරීතර පියා හා ඔබේ සබඳතාව කුමක් ද? ඔහු සත්‍යයම වෙයි. ඔහු සාමාන්‍ය මිනිසෙක් නාරායන් බවට පත් කරවන සත්‍ය ඥානය ඔබට දෙයි. ඔබ දරුවන් දන්නවා පරමාත්ම පියා සත්‍යයම බවත් ඔහු සත්‍යයේ දේශය බිහි කරන බවත්. ඔබ මෙහි එන්නේ සාමාන්‍ය මිනිසත් බවින් නාරායන බවට පත් වීමටයි. ඔබ බැරිස්ටර් කෙනෙක් ළඟට යන්නේ බැරිස්ටර් කෙනෙක් වීමටයි. ඔබ දැන් දන්නවා පරමාත්ම දෙවියන්ම ඔබට උගන්වන බව. සමහරුන්ට මෙය විශ්වාස වුවත් බුද්ධිය තුළ සැක පහල කර ගනී. එවිට අන් අය මෙසේ අසයි ඔබමයි කිව්වේ පරමාත්ම දෙවියන් අපට උගන්වනවා කියා, ඉතින් දෙවියන් අත හැර මෙහි ආවේ ඇයි ? සැක ඇති කරගෙන ඔවුන් පැන යයි. එසේ ගොස් කුමක් හෝ පාපකාරී ක්‍රියාවක් කරයි. පරමාත්ම දෙවියන් මෙසේ කියයි කාම රාගය වූ කලී ලොකුම සතුරාය! එය ජය ගැනීමෙන් ඔබට ලෝකයම ජය ගත හැකියි. පිරිසිඳු වන අය පිරිසිඳු ලෝකයට යනු ඇත. මෙය රාජයෝගා පිළිබඳ ප්‍රශ්නයයි. ඔබ එහි පාලකයින් වේ. සියලු දෙනා කර්ම ගිණුම පියවා ගෙදර යා

යුතුයි. මේ ගණු දෙනු පියවන කාලයයි. ඔබ බුද්ධිය කියනවා ස්වර්ණමය යුගය නියතයෙන්ම ස්ථාපනය වන බව. ස්වර්ණමය යුගය පිරිසිඳු ලෝකයයි. අන් සැමදෙනා විමුක්ති දේශයට යැවේ. ඉන් පසුව ඔවුන් ඔවුන්ගේම චරිත කොටස් නැවත කළ යුතු වේ. ඔබ ද දිගටම උත්සාහ කළ යුත්තේ පිරිසිඳු ලෝකයේ හිමිකරුවන් වීමටයි. ඔබ සැම දෙනාම හිමිකරුවන් ලෙස සැලකේ. යටත් වැසියන් ද හිමිකරුවන්ය. මිනිසුන් මෙසේ කියයි මගේ භාරතය! මහත්මාවරුන් සහ සන්‍යාසීවරුන් ආදීන් ද කියන්නේ මගේ භාරතය! කියාය. මෙකල නම් හැම දෙනාම අපායේ නිවැසියන්ය. අපි දැන් රාජයෝගා හදාරන්නේ දෙව්ලොව නිවැසියන් වීමටය. සියලු දෙනාම එසේ නොවේ. මේ ඥානය ලැබිය හැක්කේ දැන් පමණි. ඔවුන් කියන හැම දෙයක්ම ගන්නේ ලේඛන තුළින්ය ඔවුන් ලේඛන වල අධිකාරීත්වය ඇති අයයි. පරම පියා මෙසේ කියයි: භක්ති මාර්ගයේ වූ වේද සහ ලේඛන හදාරද්දී ඔවුන් ඉනිමගේ පහළටම ආවෝය. ඒ සියල්ල භක්ති මාර්ගයයි. පරමාත්ම පියා මෙසේ කියයි මා එන්නේ භක්ති මාර්ගය අවසාන වන විටයි. භක්ති මාර්ගයේ අයට එහි ඵලය ලබා දීම සඳහා මා ආ යුතුයි. බහුතරය භක්ති වන්තයින්ය. ඔවුන් දිගටම අහෝ පියාණනි! කියා අඬගසයි. භක්තිවන්තයින් නියතයෙන්ම මෙසේ අඬගසයි, 'අහෝ දෙවියනි, පියාණනි! අහෝ දෙවියනි!' භක්තියත් ඥානයත් අතර වෙනසක් ඇත. 'අහෝ දෙවියනි!' යැයි ඔබේ මුවින් පිට නොවිය යුතුයි. මිනිසුන්ට කල්ප භාගයක් මේ පුරුද්ද තිබේ. ඔබ දන්නවා ඔහු ඔබේ පියා බව. ඒ නිසා 'අහෝ බාබා!' යි ඔබ තවදුරටත් නොකිව යුතුයි. ඔබ පියාගෙන් උරුමය ලැබිය යුතුයි. පළමුවෙන්ම ඔබ පරමාත්ම පියාගෙන් උරුමය ලබනවාය යන ශ්‍රද්ධා විශ්වාසය තබා ගන්න. පියා ඔබ දරුවන්ට උරුමය ලබා ගැනීමේ අයිතිය දෙයි. ඔහු ඔබේ සත්‍යයම වූ පරම පියා නොවේ ද? පියා දන්නවා ඔහු ඔහුගේ දරුවන්ට උකහා තබා ගැනීමට ඥාන පැණිය දෙන බවත්, ඥානය නම් වූ ආසනයේ ඔවුන් හිඳුවන බවත්, ඔවුන්ගේ තද නින්දෙන් ඔවුන් අවදි කර දෙව්ලොවට ගෙන යන බවත්. ජීවාත්මයන් සාම දේශයේ නිවැසියන් මෙන්ම සතුටු දේශයේ නිවැසියන් බව පරමාත්ම පියා විස්තර කර දී ඇත. සතුටේ දේශයට කියන්නේ පාපයෙන් තොර ලෝකය කියායි. දෙවි දේවතාවුන් සම්පූර්ණයෙන්ම පාපයෙන් තොරයි. අනෙක වූ කලී මිහිරිතම නිවහනයි! ඔබ දන්නවා ඔබ නළුවන්ගේ නිවහන එය බවත් ඔබ එම සාම දේශයේ සිට ඔබේ භූමිකා රඟ දැක්වීමට මෙහි පැමිණෙන බවත්. ජීවාත්මයන් වන අප මෙහි නිවැසියන් නොවේ. එම නළුවන් ඒ ස්ථාන වල නිවැසියන්ය. ඔවුන් කරන්නේ ගෙදරින් පැමිණ ඇඳුම් වෙනස් කර චරිත කොටස් රඟ දැක්වීමයි. ඔබ තේරුම් ගෙන තිබෙනවා සාම දේශය ඔබ ආපසු යා යුතු නිවහන බව. සියලුම නළුවන් කරළියට පැමිණ අවසාන වූ පසු පරමාත්ම පියා පැමිණ සියලු දෙනාම නැවත ගෙදර එක්ක යයි. මේ නිසයි ඔහුට විමුක්ති දායකයා සහ මඟ පෙන්වන්නා යැයි කියන්නේ. ඔහු දුක නිවන්නා සහ සතුට ලබා දෙන්නාය. ඒ නිසා, මේ සියලු මිනිසුන් යන්නේ කොහාටද? සිතා බලන්න! ඔබ පාරිශුද්ධකරුවාණන්ට මෙහි එන්න යැයි අඬගැසුවා. කුමක් සඳහාද? ඔබේම මරණය සඳහාය! ඔබට දුක් ලෝකයේ සිටීමට අවශ්‍ය නැති නිසා දැන් ගෙදර යමුයි කියයි. ඔවුන් සියලු දෙනාම විමුක්තිය ගැන විශ්වාස කරන්නෝය. පුරාණ රාජයෝගා බොහෝ ප්‍රසිද්ධය. පුරාණ රාජයෝගා ඉගැන්වීමට ඔවුන් පිටරට පවා යයි. ඇත්තෙන්ම හඨ යෝගීවරු රාජයෝගා නොදනී. ඔවුන්ගේ යෝගාව වැරදිය. ඒ නිසයි ඔබ ගොස් ඔවුන්ට සත්‍ය රාජයෝගාව ඉගැන්විය යුත්තේ. සන්‍යාසීන්ගේ කහ ලෝගුව දුටු විට මිනිසුන් බොහෝ ගරු කරයි. බුදු දහමේ ද කහ සිවුරට බොහෝ සැලකිලි ඇත. සන්‍යාසීවරු ආවේ බොහෝ පසු වීය. බෞද්ධාගමෙහි මුලදී සන්‍යාසීවරු නොසිටියහ. බෞද්ධාගමිකයින් අතර පාපය වැඩි වන විට සන්‍යාසී ආගම බිහිවිය. මුලදීම එම ජීවාත්ම ආවේ ඉහළ සිටය. ඔහුගේ අනුගාමිකයෝ ඔහු පසුපස ආහ. මුලදී අත්හැරීම උගන්වන්නේ කුමකටද? අත්හැරීම සිදුවුණේ පසුවය. ඔවුන් එය කොපි කළේ මෙතැනින්ය. බොහෝ ක්‍රිස්තියානින්ද සන්‍යාසීන්ට ගරු කරති. කහ ලෝගුව වූ කලී හඨ යෝගීන්ගේ නිළ ඇඳුමයි. ඔබ ගෙදර සහ පවුල අත්හැරීම කළ යුතු නැත, සුදු ඇඳුම් ඇඳීම හෝ බැඳීමකින් කළ යුතු නැත. කොහොමනමුත්, සුදු ඇඳුම හොඳය. ඔබ භතියෙහි සිටිය නිසා සුදු ඇඳුම පුරුදු විය. මෙකළ සුදු ඇඳුමට බොහෝ අය කැමතිය. කෙනෙක් මළ පසු ඔහුව වසා දමන්නේ සුදු ඇතිරිල්ලකිනි. ඔබ දැන් ජීව මරණයට පත්වී සිටින නිසා සුදු අඳින එක හොඳය. පළමුවෙන්ම හැම කෙනෙකුටම පරමාත්ම පියාව හඳුන්වා දෙන්න. පියවරු දෙදෙනෙක් පිළිබඳ විස්තර කිරීමට කාලය අවශ්‍යය. ප්‍රදර්ශන වල දී ඔවුන්ට බොහෝ විස්තර දිය නොහැකියි. ස්වර්ණමය යුගයේ දී ඔබට ඇත්තේ එක පියෙකි. ඔබට ඇත්තේ ලෞකික පියෙකි. අච්චා, පියවරු තුන් දෙනාගෙන් ඔබට ඉහළම උරුමය දෙන්නේ කවර පියා ද? අශරීරික පියා උරුමය දෙන්නේ කෙසේ ද? ඔහු එය දෙන්නේ බ්‍රහ්මා හරහාය. ඔබට මේ පිංතූරය හොඳින් විස්තර කළ හැකිය. ශිව බාබා අශරීරික වන අතර ආදි දේව් වන මේ ප්‍රජාපිතා බ්‍රහ්මා මී මුත්තා වේ. පරම පියා මෙසේ කියයි ඔබ මට 'මී මුත්තා' වන ශිවා යැයි කතා නොකරයි. මා සැමගේ පරම පියා වන අතර මේ බ්‍රහ්මා මානව සංහතියේ පියාය. ඔබ සැම සොයුරන් හා සොයුරියන්ය. ඔබ ස්ත්‍රී හා පුරුෂ වුවත් ඔබේ බුද්ධිය මගින් තේරුම් ගන්නේ සොයුරු

සොයුරියන් බවයි. ඔබ උරුමය ලබා ගන්නේ පාරලෞකික පියාගෙනි. සොයුරු සොයුරියන් අතර සාපරාධී ක්‍රියා සිදු විය නොහැක. ඔවුනොවුන් අතර පාපකාරී දැක්මක් ඇත්නම් ඔවුන් පිරිහේ. ඔවුන්ට පරම සත්‍යය වූ පරම පියා අමතක වේ. පියා මෙසේ කියයි ඔබ මගේම දරුවා වූ පසුවත් මුහුණ කිලිටි කර ගත්තෙහිය! අසීමිත පියා මෙහි සිට දරුවන්ට කියා දෙයි. ඔබ ඉතා කුල්මත් බවට පත් වේ. ඔබ දන්නවා ඔබ පවුලේ අයත් සමඟ ගෙදර සිටිය යුතු බව. ඔබ ලෞකික නෑදැයින් සමඟ සිට යුතුකම් ඉටු කළ යුතුය. ඔබ භෞතික පියාට 'පියා' යැයි ඇමතිය යුතුය. ඔබ ඔවුන්ට සොයුරා යැයි නොකිය යුතුය. සාමාන්‍ය පියාට පියා කියා අමතයි. ඔබ බුද්ධියෙන් දන්නවා ඔහු ඔබේ භෞතික පියා බව. ඔබට ඥානය ඇත. මේ ඥානය අසහායයි. මෙකල ඔවුන් පියාට නම කියා කතා කරන නමුත් ඔබ අමුත්තෙක් ඉදිරියේ දී ඔබේ පියාට 'සහෝදරයා' යැයි කිවහොත් ඔබට පිස්සු යැයි ඔහු සිතනු ඇත. ඔබ බොහෝ උපායශීලී විය යුතුයි. ඔබේ ඥානය අප්‍රකට වන අතර ඔබේ නෑ සබඳකම් අප්‍රකටය. ඔබේ අන්තර් සබඳතා උපක්‍රමික විය යුතුයි. ඔබ කොහොමනමුත් එකිනෙකාට ගෞරව කරන එක හොඳය. ඔබ ඔබේ නෑදැයින්ට යුතුකම් ඉටු කළ යුතුයි. ඔබේ බුද්ධිය උසස් විය යුතුය. අපි බාබාගෙන් උරුමය ඉල්ලා සිටිමු. කොහොමනමුත්, මාමාට 'මාමා' යැයි ද, පියාට 'පියා' යැයි ද ඇමතිය යුතුය. බී. කේ. වරු නොවූ අය සහෝදර සහෝදරියන් ගැන නොදනී. බ්‍රහ්ම කුමාර් සහ කුමාරිවරු වූ අය පමණක් මෙය දනී. පිටත මිනිසුන් මුලින්ම මෙය ඇසීමෙන් තිගැස්සෙනු ඇත. මේ දේවල් තේරුම් ගැනීමට ඉතා හොඳ බුද්ධියක් අවශ්‍ය වේ. පරමාත්ම පියා ඔබ දරුවන්ගේ බුද්ධිය එතරම්ම අසීමිත බවට පත් කරවයි! පෙරදී ඔබට තිබුණේ සීමිත බුද්ධියකි. දැන් ඔබේ බුද්ධිය අසීමිත බව කරා යයි. ඔහු අපේ අසීමිත පියාය. ඔවුන් සැවොම සොයුරු සොයුරියන්ය. නෑදෑකම් අනුව ලේලියට ලේලිය ලෙස ද නැන්දම්මාට නැන්දම්මා ලෙසද ඇමතිය යුතුය. ඔවුන් දෙදෙනාම මෙහි ආවත් ඔවුන්ට සොයුරිය යැයි නොකිය යුතුයි. ගෙදර සිටියා වුවත් උපක්‍රමිකව සබඳකම් පැවැත්විය යුතුය. මිනිසුන් කියන දේ ගැනත් ඔබ සලකා බැලිය යුතුයි. එසේ නොවුව හොත් ඔවුන් කියාවි ඔබ ස්වාමිපුරුෂයන් සොයුරන් කරන අතර නැන්දම්මලා සොයුරියන් කරනවා කියා. ඔබට උගන්වා ඇති දේ ගැන ඔවුන් පුදුම වේ. ඔබට මිස වෙන අයට ඥානය පිළිබඳ මෙම කරුණු තේරුම් ගත නොහැකිය. ක්‍රම සහ විධි දන්නේ ඔබ පමණි කියා කියමනක් ඇත. ඔබ දැන් එම පියාගේ දරුවන් වී ඇත. එමනිසා, ඔබ ඔහුගේ ක්‍රම සහ විධි දනී. කිසිවෙක් පටලැවිල්ලට නොවැටෙන සේ ඔබ ප්‍රවේසම් විය යුතුය. ප්‍රදර්ශන වලදී ඔබ කිව යුතුයි ඔබට උගන්වන්නේ පරමාත්ම දෙවියන් කියා. දැන් අපට කියන්න ඔහු කවුද කියා! ඔහු අශරීරික ශිවා ද? ශ්‍රී ක්‍රිෂ්ණා ද? රාජ යෝගා උගන්වන්නේ පරමාත්ම පියා නිසා ක්‍රිෂ්ණාගේ උපත ශිවා ගේ උපතින් පසුව බව පැහැදිලිය. ඔබේ බුද්ධියට ඇතුළු වී ඇත්තේ උත්තරීතර ජීවාත්මය වන ශිවා එනතුරු ඔහුගේ උපන් දිනය සැමරිය නොහැකි බවයි. ශිවා පැමිණ ක්‍රිෂ්ණා ගේ දේශය සාදන තුරු ක්‍රිෂ්ණාගේ උපන් දිනය සමරන්නේ කෙසේ ද? ඔවුන් ක්‍රිෂ්ණාගේ උපන් දිනය සැමරුවත් ඔවුන් කිසි දෙයක් තේරුම් ගෙන නැත. ක්‍රිෂ්ණා කුමාරයෙක් වන අතර ඔහු කුමාරයෙක් වූයේ නිසැකයෙන්ම ස්වර්ණමය යුගයේ දීය. දේව් දේවතාවුන්ගේ රජ දහන ඇත, ක්‍රිෂ්ණාට පමණක් නොවේ අධිරාජ්‍යය ලැබෙන්නේ. එය නිසැකවම ක්‍රිෂ්ණාගේ දේශයයි. ඔවුන් මෙය කාන්ස් යක්ෂ දේශය බවත් ක්‍රිෂ්ණා දේශය ගැන වෙනමත් කතා කරයි. කාන්ස් දේශය විනාශ වූ පසු ක්‍රිෂ්ණා දේශය පිහිටවනු ලැබීය. මේ දෙකම භාරතයේය. නව ලෝකයේ කාන්ස් යක්ෂයින් ආදීන් සිටිය නොහැක. කාන්ස් දේශය යනු කලි යුගයයි. බලන්න මිනිසුන් කොතරම් ඇත්ද කියා! ස්වර්ණමය යුගයේ ඇත්තේ ඉතා සුළු දෙනෙකි. දෙවි දේවතාවුන් යුද්ධ නොකරති. ක්‍රිෂ්ණා දේශය හෝ විෂ්ණු දේශය යැයි කීවත්, දේව් දේවතා ප්‍රජාව හෝ යක්ෂ ප්‍රජාව කීවත් ඒ සැම මෙහිය. කොහොමනමුත්, සුර අසුරයින් අතර හෝ කෞරව පාණ්ඩවයින් අතර යුද්ධ සිදු වී නොමැත. ඔබ ජය ගන්නේ රාවණ්වය. පරම පියා මෙසේ කියයි ඔබ පාප පහ ජය ගත්තොත් මුළු ලොවම ජය ගත්තා වෙයි. යුද්ධ පිළිබඳ ප්‍රශ්නයක් නැත. ගැටුම් යනු ප්‍රචණ්ඩත්වයයි. ඔබ රාවණ් ජය ගත යුතුයි නමුත්, ප්‍රචණ්ඩත්වයෙන් තොරවයි. පරමාත්ම පියා සිහි කළ පමණින් අපේ පව් විනාශ වේ. යුද්ධ කිරීම් ආදියෙහි ප්‍රශ්නයක් නැත. පියා පවසයි ඔබ තමෝප්‍රධාන් වී ඇති අතර දැන් නැවත සතෝප්‍රධාන් බවට පත් වේ. භාරතයේ පුරාණ රජයෝගාව ඉතා ප්‍රසිද්ධය. ඔබේ බුද්ධිය තුළින් මා සමඟ යෝගා වී ඔබේ පව් විනාශ කර ගන්න යැයි පරමාත්ම පියා කියයි. පරම පියා වූ කලී පාරිශුද්ධකරුවාණන්ය. ඒ නිසා ඔබේ බුද්ධිය ඔහු සමඟ යෝගා මඟින් සම්බන්ධ කර, අපිරිසිදු බවින් පිරිසිදු බවට පත් වන්න. ඔබ දැන් ඔහු සමඟ ප්‍රායෝගිකව යෝග වෙමින් සිටී. මෙහි සටනක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. හොඳින් අධ්‍යයනය කරමින් පරමාත්ම පියා සමඟ යෝග වන අය පියාගෙන් උරුමය ලබයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට

නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සහෝදරත්වයේ ඥානය රඳවාගෙන පුහුණු කරන අතර අපේ නෑදෑයින්ට යුතුකම් ඉටු කරන්න. සැම අය සමඟ දක්ෂ ලෙස සම්බන්ධ වන්න. සාපරාධී දැක්මක් නොතිබිය යුතුයි. ගිණුම් පියවන මේ කාල සීමාවේදී ඔබ සම්පූර්ණයෙන්ම පිරිසිඳු විය යුතුයි.
2. පරම පියාගෙන් සම්පූර්ණ උරුමය ලබා ගැනීමට නම් අධ්‍යයනය හොඳින් කර පාරිශුද්ධකරුවාණන් සමඟ යෝග වී පාරිශුද්ධත්වයට පත් වන්න.

**වරදානය:** ඔබ ඔබගේ අංගසම්පූර්ණත්වයේ පදනමින්, කාලය සමීපයට ගෙන එන මාස්ටර් නිර්මාණකරුවෙක් වේවා.

කාලය ඔබගේ නිර්මාණයක් වන අතර ඔබ මාස්ටර් නිර්මාණකරුවන්ය. නිර්මාණකරු, නිර්මාණය මත යැපෙන්නේ නැත; නිර්මාණකරු, ඔහුගේ නිර්මාණය, ඔහු මත යැපෙන්නක් කරවයි. එබැවින් කාලය ඔබව අංගසම්පූර්ණ කරයි කියා කිසිවිටෙක නොසිතන්න. ඔබ අංගසම්පූර්ණ වී, කාලය සමීපයට ගෙන ආ යුතුයි. පැමිණෙන ඕනෑම බාධකයක් එයට අයත් කාලයේදී අනිවාර්යෙන් පිටව යයි, නමුත් ඔබ පරිවර්ථන බලයෙන්, එම කාලයට පෙර එය පරිවර්ථනය කරන්නේ නම්, එවිට එහි ගෞරවය ඔබට ලැබෙයි. මෙම කාලයට අනුව පරිවර්ථනය සිදුවන්නේ නම්, ඔබට එහි ගෞරවය ලැබෙන්නේ නැත.

**පාඨය:** සැබෑ කර්මයෝගීවරු වන්නේ, කර්ම සහ යෝගාව අතර තුලනයක් තබා ගන්න අය පමණයි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

ඔබේ භෞතික අවයව වල සහාය ඇති තාක් කල්, ඔබ අනිවාර්යෙන්ම ක්‍රියා කළ යුතුය. කෙසේවෙතත්, කර්මයේ බන්ධනයක් නොතිබිය යුතුය, නමුත් තිබෙන්නේ කර්ම සම්බන්ධතාවයකි. ජීවන මුක්ති අවධිය යන්නෙන් අදහස් කරන්නේ: ඔබ ක්‍රියාවන්හි බරක් නොමැතිව විශාල සාර්ථකත්වයක් අත්විඳියි. නිදහස් වූ අය නිරන්තරයෙන් සාර්ථකත්වයේ ප්‍රතිමූර්ති වේ. ජීවන මුක්තිය ලැබූ ජීවාත්මයක් අධ්‍යාත්මික කුල්මත්භාවයෙන් මෙසේ කියනු ඇත: ජයග්‍රහණය සහතිකයි, සාර්ථකත්වය මගේ ජන්ම අයිතියයි.